මිල්කෝ පුද්ගලික සමාගම - 2023
---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 ව්‍යාවනය කළ මතය

මිල්කෝ පුද්ගලික සමාගමේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

සමාගමේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මම මතයක් ප්‍රකාශ නොකරමි. මතය ව්‍යාවනය සඳහා පදනම කොටසේ සාකච්ඡා කර ඇති කරුණුවල වැදගත්කම හේතුවෙන් මෙම මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් හා උචිත විගණන සාක්ෂි ලබා ගැනීමට මා හට නොහැකි විය.

1.2 ව්‍යාවනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මම මතයක් ප්‍රකාශ නොකරමි.

1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලටඅනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සමාගම අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය සමාගම ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සමාගමේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සමාගමේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරික්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, සමාගමේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව පවත්වනු ලබන විගණනය මත පදනම්ව සමාගමේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ වගකීම වේ. කෙසේ වුවද, මතය වියාචනය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු හේතුවෙන් මෙම මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් හා උචිත විගණන සාක්ෂි ලබා ගැනීමට මා හට නොහැකි විය.

1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

1.5.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

	අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 01 හි 32 ඡේදය ප්‍රකාරව ප්‍රමිතයෙහි ඉඩ දී ඇති අවස්ථාවලදී හැර වත්කම්, වගකීම්, ආදායම් හා වියදම් ශේෂ හිලව් කර මූල්‍ය ප්‍රකාශනයන්හි ඉදිරිපත් නොකළ යුතු වුවද ණය හිමි ශේෂ තුළ තිබූ එකතුව රු.49,039,446 ක් වූ හර ශේෂ හඳුනාගෙන අවශ්‍ය ගැලපීම් කිරීමෙන් තොරව බැර ශේෂයන්ට හිලව් කර මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ දක්වා තිබුණි. තවද, ණයගැති වට්නාකම් තුළ තිබූ එකතුව රු.27,325,580 ක්වූ බැර ශේෂයන් හා එකතුව රු.22,815,176 ක් වූ කාර්යාල සේවක ණයගැති, අත්තිකාරම් තැන්පතු හා ඉදිරියට කළ ගෙවීම් සහ අනෙකුත් ණයගැති බැර ශේෂයන් හඳුනාගෙන අවශ්‍ය ගැලපීම් කිරීමෙන් තොරව හර ශේෂයන්ට හිලව් කර තිබුණි.	ප්‍රධාන කාර්යාලයේ මූල්‍ය ප්‍රකාශනයේ ජංගම වගකීම් තුල වසර 5කට අධික කාලයක සිට පැවත එන හර ශේෂ යම් ප්‍රමාණයක් පවතින අතර ඉන් සමහරක් සඳහා මූලාශ්‍ර ලේඛනයන් සොයාගැනීමට අපහසු අතර තවත් සමහරක් ගිණුම්කරණ දෝෂ මත නිර්මාණය වී ඇත. ගිණුම්කරණ දෝෂ මත හටගෙන ඇති ඇතැම් ශේෂයන් මේ වන විට නිවැරදි කිරීමට කටයුතු කර ඇත.	ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත ප්‍රකාරව කටයුතු කළ යුතුය.
(ආ)	ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 16 හි 31 සහ 34 ඡේද අනුව වත්කම් ප්‍රත්‍යාගණනයක් සිදුකළ පසු නැවතත් නිශ්චිත කාල සීමාවක් තුලදී වත්කම් ප්‍රත්‍යාගණනය සිදුකළ යුතු වුවද සමාගම විසින් 2008 වර්ෂයේ ප්‍රත්‍යාගණනය කිරීමෙන් පසු සමාලෝචිත වර්ෂය දක්වාම වත්කම් ප්‍රත්‍යාගණනයක් සිදු නොකර තිබීම හේතුවෙන් නව ප්‍රත්‍යාගණිත වට්නාකම් ගිණුම් පොත්වල ඇතුළත් වී නොතිබුණි.	ඉදිරි මූල්‍ය වර්ෂයක් තුලදී වත්කම් ප්‍රත්‍යාගණනයක් සිදු කිරීම කෙරෙහි කළමනාකාරීත්වයේ අවධානයට යොමු කිරීමට බලාපොරොත්තුවේ.	ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති ප්‍රකාරව වත්කම් ප්‍රත්‍යාගණනය සිදු කර ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුය.
(ඇ)	ශ්‍රී ලංකා ගිණුම් ප්‍රමිති 37 හි 14 ඡේදය පරිදි වර්තමාන බැඳීමක් පැවතීම, එම බැඳීම නිරවුල් කිරීමේදී ව්‍යාපාරයේ සම්පත් පිටතට ගලායාමේ සම්භාවිතාවක් පැවතීම හා එහි වට්නාකම විශ්වාසදායී ලෙස ඇස්තමේන්තු කළ හැකි වීම යන කරුණු අනුව මූල්‍ය ප්‍රකාශනයන්හි ප්‍රතිපාදන හඳුනාගත යුතු වුවද සමාගම අඛණ්ඩ අලාභ ලබන තත්ත්වයක් තුල ඒ පිළිබඳ අවධානය	පවතින මූල්‍ය වාර්තා වලට අනුව පොලොන්නරුව කර්මාන්තශාලාවේ 2015 සිට 2020 මූල්‍ය වර්ෂය දක්වා ප්‍රසාද දීමනා සඳහා වාර්ෂිකව ප්‍රතිපාදන වෙන්කිරීමක් සිදු කර ඇත. රු.2,180,689 ක ප්‍රසාද දීමනා ගෙවීම් සඳහා	ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති ප්‍රකාරව කටයුතු කළ යුතුය.

	යොමු නොකර 2020 වර්ෂයේ සිට ප්‍රසාද දීමනා ගෙවීම් වෙනුවෙන් රු.2,180,689 ක ප්‍රතිපාදන මූල්‍ය ප්‍රකාශනයන්හි හඳුනාගෙන තිබීම හේතුවෙන් ජංගම වගකීම් එම ප්‍රමාණයෙන් වැඩියෙන් දැක්වුණි.	ප්‍රතිපාදන ලෙස මූල්‍ය ප්‍රකාශන තුල පෙන්වනු ලබන්නේ 2020 වර්ෂයේ සිට ඉදිරියට ගෙන එනු ලැබූ ශේෂයයි.එය 2024 මූල්‍ය ප්‍රකාශන තුලින් නිවැරදි කිරීමට කටයුතු කරනු ලැබේ.	
(ඇ)	ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිත 09 හි 5.5.15 ඡේදය ප්‍රකාරව වෙළඳ ණයගැති ශේෂය වන රු. 510,957,806 ක් සඳහා පසුකාලීන හානිකරණ හඳුනාගැනීම් මැනීම සඳහා අපේක්ෂිත ණය අලාභ ක්‍රමය (Expected Credit Loss Method) භාවිතා කළයුතු වුවත් එසේ ගණනය නොකිරීම නිසා සමාලෝචිත වර්ෂයේ වෙළඳ හා අනෙකුත් ණයගැතියන් අධි ගණනය වී තිබුණි.	නිවැරදි ලෙස ණයගැති කාල විශ්ලේෂණ පිළියෙළ කරගැනීමෙන් අනතුරුව ණයගැතියන් සඳහා අපේක්ෂිත ණය අලාභ ක්‍රමය භාවිතා කර අදාළ වෙන් කිරීම් ගිණුම්තුල සිදු කිරීමට බලාපොරොත්තු වේ.	ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිති ප්‍රකාරව කටයුතු කළ යුතුවේ.

1.5.2 ගිණුම්කරණ අඩුපාඩු

	විගණන නිරීක්ෂණය	කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	සමාලෝචිත වර්ෂයේ සමාගමේ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය අනුව සුළු මුදල් ශේෂය රු.3,784,814ක් ලෙස දක්වා තිබුණද, ප්‍රධාන කාර්යාලයේ මූල්‍ය ප්‍රකාශනවල සුළු මුදල් ශේෂ තුළ දීර්ඝ කාලයක සිට පැවත එන වෙනත් ගිණුම් 03ක බැර ශේෂ එකතුව රු.1,763,306 ක් පැවතීම හේතුවෙන් සමාගමේ මූල්‍ය ප්‍රකාශනයෙහි සුළු මුදල් ශේෂය අඩුවෙන් දැක්වුණි.	මෙම ශේෂයන් වසර ගණනාවක් තිස්සේ ගිණුම් තුල පවත්නා ශේෂයන් වන අතර අදාළ ශේෂ සඳහා පදනම් වූ සාක්ෂි හා තොරතුරු හඳුනාගැනීමෙන් අනතුරුව ඉදිරි ගිණුම් වර්ෂ තුලදී නිවැරදි කිරීමට කටයුතු කරනු ලැබේ.	සුළු මුදල් ශේෂ තුළ ඇති වෙනත් ගිණුම් 03 ක දීර්ඝ කාලයක සිට පවතින බැර ශේෂ විශ්ලේෂණය කර හේතු හඳුනාගෙන අවශ්‍ය ගැලපීම් කළ යුතුය.
(ආ)	සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට මූල්‍ය ප්‍රකාශන සටහන් අංක 05 අනුව දිගුකාලීන අත්තිකාරම් ශේෂය වූ යුරෝ 201,218 ක පරිවර්තන විනිමය ලාභය රු.34,074,094ක් විය යුතු වුවද එම වටිනාකම රු.35,479,314ක් වශයෙන් ගිණුම්ගත කිරීම හේතුවෙන් විදේශ විනිමය ලාභය රු.829,207 කින් වැඩියෙන් දැක්වුණි.	www.exchangerates.org.uk යන වෙබ් අඩවියෙහි සඳහන් යුරෝ සඳහා ඇති විනිමය අනුපාතිකය පදනම් කරගෙන 2023.12.31 දිනට අදාළ අත්තිකාරමේ වටිනාකම ගණනය කර ඇත.	විදේශ විනිමය පරිවර්ථනය කිරීමේදී පිළිගත් වඩාත් යෝග්‍ය විනිමය අනුපාතිකයන් භාවිතා කර විදේශ විනිමය පරිවර්ථනය කිරීමට කටයුතු කළ යුතුය.

(ඇ)	මූල්‍ය ප්‍රකාශනයන්හි දක්වා තිබුණු රු.1,664,030,771 ක තොග ශේෂය තුල වර්ෂ කිහිපයක සිට අඛණ්ඩව ඉදිරියට එන භෞතිකව සමාගම තුල නොමැති රු.31,928,087 ක අමුද්‍රව්‍ය තොගයක් ද, රු.10,327,148 ක නිමි භාණ්ඩ තොගයක් ද, 2018 වර්ෂයේ සිට තොගය තුළ ඇතුළත්ව තිබුණ ද, සමාලෝචිත වර්ෂය අවසානය වන විටත් මේ වෙනුවෙන් වෙන්කිරීමක් මූල්‍ය ප්‍රකාශනවල සිදු කර නොතිබුණි. තවද රු.20,713,467ක් වු වෙනත් තොග ශේෂය සම්බන්ධයෙන් තොරතුරුද විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.	අවසන් ගිණුම් තුල පවතින රු.මිලියන 31 ක අමුද්‍රව්‍ය හා රු.මිලියන 10 ක නිමිද්‍රව්‍ය තොග ශේෂයන් ගිණුම් තුල පැවතියත් මේ වන විට තොග භෞතිකව සමාගම සතුව නොපවතී. රු.මිලියන 20.7ක් වූ අනෙකුත් ශේෂයන් පිළිබඳවද තොරතුරු හඳුනාගැනීමෙන් අනතුරුව ගිණුම් තුලින් නිවැරදි කිරීමට කටයුතු කරනු ලැබේ.	වර්ෂ කිහිපයක සිට අඛණ්ඩව ඉදිරියට එන භෞතිකව සමාගම තුල නොමැති තොග සම්බන්ධයෙන් වෙන්කිරීමක් මූල්‍ය ප්‍රකාශනවල සිදු කළ යුතු අතර තොග ශේෂය සම්බන්ධයෙන් තොරතුරුද විගණනයට ඉදිරිපත් කළ යුතුය.
(ඈ)	2025 අප්‍රේල් 01 දිනැති අංක TO/REV/05/33/6 දරණ භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවේ සනාථනය අනුව බඩල්ගම කිරි සැකසුම් මධ්‍යස්ථානය ස්ථාපිත කිරීමේ ව්‍යාපෘතිය සඳහා උපණය ලබා දී නොමැති බව හා එය 2021 වර්ෂයේදී කෘෂිකර්ම අමාත්‍යාංශයේ 118-2-3-54-2507-0/12 යටතේ රජයේ ආයෝජනයක් ලෙස ගිණුම්ගත වී ඇති බව දක්වා තිබුණද සමාගම විසින් භාණ්ඩාගාරයට ගෙවිය යුතු ණය ලෙස රු.12,641,310,517 ක් 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශනයන්හි දක්වා තිබුණි.	මේ පිළිබඳ වැඩිදුර සොයාබලා වගකිවයුතු පාර්ශවයන් වෙතින් කරුණු විමසීමෙන් හා අදාළ අනුමැතීන් ලබාගැනීමෙන් අනතුරුව මෙම ණය ශේෂයන් සමාගමේ ගිණුම් තුලින් ඉවත් කිරීමට ඉදිරියේදී කටයුතු කරනු ලැබේ.	නිවැරදිව ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුය.
(ඉ)	සමාගමේ ගිණුම් ප්‍රතිපත්තිය අනුව පොලී ආදායම උපචිත පදනම මත හඳුනාගන්නා බව සඳහන් වුවද උපලේඛණය අනුව දේශීය පොලී ආදායම මුදල් පදනම මත හඳුනාගෙන තිබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ ලැබිය යුතු පොලී වටිනාකම වූ රු.6,377,034ක් මූල්‍ය ප්‍රකාශනයන්හි හඳුනාගෙන නොතිබුණි.	දේශීය තැන්පතු කෙටිකාලීන ආයෝජන ලෙස ගිණුම් තබා ඇති බැවින් එහි පොලී ආදායම මුදල් පදනමින් හඳුනාගනු ලබයි.කෙසේ වෙතත් ඉදිරි වර්ෂවල මූල්‍ය ප්‍රකාශන සැකසීමේදී ගිණුම් ප්‍රතිපත්ති මගින් අනාවරණය කිරීමට කටයුතු කරනු ලැබේ.	ගිණුම් ප්‍රතිපත්තිය අනුව පොලී ආදායම් නිවැරදි ලෙස හඳුනාගෙන ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුය.
(ඊ)	2007 වර්ෂයේදී පුද්ගලික ආයතනයකින් වරින් වර ලැබුණු එකතුව රු.12,005,844 ක් වූ ප්‍රදානය විලම්බිත ආදායමක් ලෙස වාර්ෂිකව මූල්‍ය ප්‍රකාශනවලට හඳුනාගැනීම වෙනුවට මූල්‍ය ප්‍රකාශනයේ වෙනත් පාර්ශවයන්ට ගෙවිය යුතු ශේෂය යටතේ ගිණුම්ගත කර තිබුණි.	පුද්ගලික ආයතනයක් මගින් සමාගම වෙත ලද මූල්‍ය ප්‍රදාන අම්බලන්තොට කිරිශීත කිරීමේ මධ්‍යස්ථානයේ ඉදිකිරීමේ කටයුතු සඳහා යෙදවූ බවට තොරතුරු හඳුනාගෙන ඇත. ඒ අනුව අදාළ ශේෂයන් ඉදිරි වර්ෂයේ අවසන් ගිණුම් තුලින් නිවැරදි කිරීමට කටයුතු කරනු ලැබේ.	ප්‍රදානයන් නිවැරදි ලෙස හඳුනාගෙන ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුය.

(උ)	මූල්‍ය ප්‍රකාශන තුළ තොග වෙනුවෙන් රු.12,096,362ක වෙන්කිරීමක් සිදුකර ඇති අතර මේ තුළ වූ භාවිතයට ගත නොහැකි තොග හඳුනාගෙන පොත්වලින් ඉවත් කිරීමට කටයුතු කර නොතිබුණි.	මෙහි තොග ඌණතාවයක් සිදුවී නොමැති අතර මීට වසර ගණනාවකට පෙර ගබඩාවෙහි පැවති භාවිතයට ගත නොහැකි තොග සඳහා ගිණුම් තුල වෙන්කිරීමක් පමණක් සිදුකර ඇත. ඉදිරියේදී මෙවැනි තොගයක් පවතීද යන්න පරීක්ෂාකර බලා ගිණුම් තුලින් ඉවත් කිරීමට කටයුතු කරනු ලැබේ.	ආයතනයේ තොග පාලනය විධිමත් කිරීමට කටයුතු කළ යුතුය.

1.5.3 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

	විෂයය	මුදල රු.	නොසැපයූ විගණන සාක්ෂි	කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	ජාතික කිරි මණ්ඩලයට ගෙවිය යුතු ශේෂය	2,108,063	ශේෂ සනාථන, කාල විශ්ලේෂණ	මෙම ශේෂයන් වසර ගණනාවක් තිස්සේ පැවත එන ශේෂ වන අතර ඒවා සනාථ කිරීම සඳහා කිසිදු මූලාශ්‍ර ලියවිල්ලක් සමාගම සතුව සොයාගැනීමට නොහැක.	මූලාශ්‍ර ලේඛණ පරීක්ෂා කර ගණුදෙනු ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුය.
(ආ)	පොල්ගහවෙල කර්මාන්තශාලාවේ වෙළඳ ණයහිමි ශේෂය යටතේ සඳහන් වියදම් ණයහිමි ශේෂය.	25,570,814	ශේෂ සනාථන, කාල විශ්ලේෂණය	අදාළ මුදල් 2024 වර්ෂය තුලදී අදාළ සැපයුම්කරුවන් වෙත ගෙවා නිම කිරීමට සමාගම විසින් කටයුතු කර ඇත. ඉතිරි ශේෂය 2024 ගිණුම් තුලින් නිවැරදි කිරීමට කටයුතු කරන ලදී.	ණය හිමි ශේෂයන්ට අදාළ කාල විශ්ලේෂණයක් ලබාගත හැකි පරිදි ගිණුම්කරණ කටයුතු පවත්වාගෙන යාම හා ණය හිමියන්ට නිසි පරිදි ගෙවීම් සිදු කළ යුතුය.
(ඇ)	ප්‍රධාන කාර්යාලයේ සහ කොළඹ කර්මාන්තශාලා ණයගැති වටිනාකම.	388,525,297	කාල විශ්ලේෂණ, උපලේඛණ	ප්‍රධාන කාර්යාලය හා කොළඹ කර්මාන්තශාලාවට අදාළව කාල විශ්ලේෂණ ඉදිරි මූල්‍ය වර්ෂවලදී විගණනය වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කරනු ලැබේ.	කාල විශ්ලේෂණ සහ උපලේඛණ ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතුය.

(ඇ)	පුද්ගලික සමාගමකට ගෙවිය යුතු වෙළඳ ණයහිමි ශේෂය.	30,661,317 ශේෂ සනාථන	අදාළ තහවුරු ලේඛන ලබාදෙන ලෙස සැපයුම්කරු වෙත දැනුවත් කරමින් ලියාපදිංචි තැපැල මාර්ගයෙන් ලිපි යවා ඇති අතර නැවත විද්‍යුත් තැපැල මාර්ගයෙන්ද සිහිකැඳවීම් ලබා දී ඇත.	ශේෂ සනාථන ඉදිරිපත් කිරීම සහ ගෙවියයුතු පාර්ශව හඳුනාගෙන ශේෂ නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය.

1.6 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

1.6.1 ලැබිය යුතු මුදල්

විගණන නිරීක්ෂණය	කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
දිගන, පොළොන්නරුව සහ අඹේවෙල යන කර්මාන්තශාලා 3 හි රු.93,993,204 ක ණයගැති ශේෂ තුළ එකතුව රු.20,678,111 ක්වූ වර්ෂ 05ට වැඩි වෙළඳ ණයගැති ශේෂ පැවතුණද එම ශේෂ අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.	සියලු කර්මාන්තශාලා හා ප්‍රධාන කාර්යාලයට අදාළ ණයගැති ශේෂ තුල පවතින වසර පහකට වඩා වැඩි ශේෂ පිළිබඳව විශ්ලේෂණය කිරීම් මේ වන විට ආරම්භ කර ඇති අතර තොරතුරු හඳුනාගෙන තහවුරු කරගැනීමෙන් අනතුරුව අයකරගැනීම සඳහා කටයුතු කරනු ලැබේ.	හිඟ ණයගැති ශේෂ අයකර ගැනීමට කටයුතු කළ යුතුය.

1.6.2 ගෙවිය යුතු මුදල්

	විගණන නිරීක්ෂණය	කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	ප්‍රධාන කාර්යාලයේ රු.256,943,646 ක වෙළඳ ණයහිමි ශේෂයට අදාළව ඉදිරිපත් කරන ලද වයස් විශ්ලේෂණය අනුව වසර 05ට වැඩි රු.11,205,608 ක් වූ ශේෂයන් පැවති අතර එම වටිනාකම් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.	අදාළ ශේෂ අතරින් ආයතන 2 ක පැවති ශේෂයන් 2024 ගිණුම් වර්ෂය තුලදී නිරවුල් කිරීමට කටයුතු කළ අතර අනෙකුත් ශේෂයන් පිළිබඳව නිවැරදි තොරතුරු අනාවරණය කරගැනීමෙන් අනතුරුව ගිණුම් තුලින් නිවැරදි කිරීමට කටයුතු කරනු ලැබේ.	නිවැරදි තොරතුරු අනාවරණය කරගැනීමෙන් අනතුරුව ශේෂ නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය.
(ආ)	මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ගෙවිය යුතු වෙනත් ශේෂයෙහි ඇතුළත් රු.22,169,976 ක්වූ ප්‍රධාන කාර්යාලයෙහි වෙනත් පාර්ශවයන්ට ගෙවිය යුතු ශේෂය තුල වසර 21 ක් පැරණි රු.7,795,228 ක් වූ ගෙවිය යුතු රඳවාගත් තැන්පතු පැවතියද එම ශේෂ නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.	සමාගම විසින් රඳවාගත් තැන්පතු ආපසු ගෙවීම් සිදු කරනු ලබන්නේ අදාළ මුදල රඳවාගැනීමේ කාල සීමාව ඉක්මවූ පසු එම සේවා සපයන්නන් විසින් රඳවාගත් මුදල් නැවත ලබාදෙන ලෙස ඉල්ලුම් කිරීමෙන් පසුව වන අතර වර්තමානය වන තෙක් එම සේවා සපයන්නන් විසින් එම මුදල් නැවත ඉල්ලුම් කර නොමැත.	නිවැරදි තොරතුරු අනාවරණය කරගැනීමෙන් අනතුරුව ශේෂ නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය.

1.7 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

	නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව	අනුකූල නොවීම	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	2021 නොවැම්බර් 16 දින අංක 1/2021 දරණ රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ මෙහෙයුම් අත්පොතේ 6.6 ඡේදය හා මාර්ගෝපදේශයේ 3.1 මාර්ගෝපදේශය	ගිණුම් වර්ෂය අවසන් වී දින 60 ක් ඇතුළත මූල්‍ය ප්‍රකාශන සහ කෙටුම්පත් වාර්ෂික වාර්තාව විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත් 2023 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කර තිබුණේ 2025 මැයි 23 වන දිනය. ඒ අනුව මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමට දින 448 ක් ප්‍රමාද වී තිබුණි. තවද රාජ්‍ය ව්‍යාපාර සඳහා අදාළ වන මාර්ගෝපදේශයේ ඇමුණුම 3 හි සඳහන් පරිදි කෙටුම්පත් වාර්ෂික වාර්තාව සකස් කර මූල්‍ය ප්‍රකාශන සමග ඉදිරිපත් කර නොතිබුණි.	අදහස් දක්වා නොමැත	චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන සහ වාර්ෂික වාර්තා සකස්කර විගණනයට ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතුය.
(ආ)	ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.1.(ආ) මාර්ගෝපදේශය	සමාගම විසින් අවම වශයෙන් වසර තුනක කාලයක් සඳහා ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්මක් හා 2023 වර්ෂය සඳහා නිතිපතා යාවත්කාලීන කරන ලද ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.	අදහස් දක්වා නොමැත.	ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය අනුව ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කිරීමට කටයුතු කළ යුතුය.

1.8 මුදල් කළමනාකරණය

	විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	බැංකු අයිරාව වෙනුවෙන් එක්සත් ජනපද ඩොලර් ස්ථාවර තැන්පතුව ඇපයට තබමින් ලබාගෙන ඇති රු.1,200,000,000 ක බැංකු අයිරා පහසුකම වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේදී දරණ ලද අයිරා පොලී වියදම රු.323,947,216 ක් වූ අතර එයට අදාළ ස්ථාවර තැන්පත් පොලී ආදායම රු.124,359,900 ක් වූයෙන් රු.199,587,316 ක අතිරේක පිරිවැය අවම කරගැනීම කෙරෙහි අවධානය යොමු වී නොතිබුණි.	2023 වර්ෂයේදී ලබාගෙන ඇති අයිරා පහසුකම භාවිතා කර ඇති ප්‍රමාණය අනුව බැංකුව විසින් ඊට අදාළ පොළිය අයකරගෙන ඇති අතර එය ඇප තබා ඇති ස්ථාවර තැන්පතුවට අදාළ පොළී ආදායම ඉක්මවා ඇත. කෙසේ වෙතත් අයිරා පහසුකමට අදාළ පොළී අනුපාතය අඩුකරගැනීම සඳහා ඉල්ලුම් කළද බැංකු අයිරා පොළී අනුපාත අඩුකිරීමේ හැකියාවක්	බැංකු අයිරා ශේෂය අවම කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය.

		නොමැති බව බැංකුව සමාගම වෙත දන්වා ඇත.	
(ආ)	මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ දක්වා තිබුණු රු.1,689,978 ක් වටිනා නිදන් අරමුදල වසර ගණනාවක සිට පැවත එන ශේෂයක් වූ අතර ඉදිරි වර්ෂවලදී සිදුකරන කිරි මිලදී ගැනීම් සඳහා වන මූල්‍යමය අවශ්‍යතාවය මත උපයෝජනය කරන බව මූල්‍ය ප්‍රකාශනයන්හි සටහන් අංක 12 යටතේ හෙළිදරව් කර තිබුණ ද ඒ අනුව කටයුතු කර නොතිබුණි.	අදාළ අරමුදල වසර ගණනාවක් තිස්සේ පැවත එන ශේෂයක් වන බැවින් සහ මේ සඳහා සමාන මුදලක් වෙනම බැංකු ගිණුමක පවත්වාගෙන නොයන බැවින් ඉදිරියේදී මෙම ශේෂයද සමාගමේ ඉහල කළමණාකාරීත්වයේ අනුමැතියට යටත්ව රඳවාගත් ඉපැයීම් තුලට නැවත ඇතුළත් කිරීමට බලාපොරොත්තු වේ.	මූල්‍ය ප්‍රකාශනයන්හි සටහන් අංක 12 යටතේ හෙළිදරව් කර කර ඇති පරිදි කටයුතු කළ යුතුය.

1.9 බදු රෙගුලාසිවලට අනුකූල නොවීම

	විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	මූල්‍ය ප්‍රකාශනයන්හි රජයේ වෙනත් ආයතන වලට ගෙවිය යුතු ශේෂය යටතේ රු.396,413 ක්වූ ගෙවිය යුතු ආරක්ෂක බදු සඳහා දඩ හා රු.436,133 ක්වූ ගෙවිය යුතු උපයන විට දඩ මුදල් වශයෙන් එකතුව රු.832,546 ක් 2002 වසරේ සිට පැවත එන අතර එම ශේෂ නිරවුල් කිරීමට සමාලෝචිත වර්ෂය දක්වාම කටයුතු කර නොතිබුණි.	මෙය 2002 වර්ෂයේ ගිණුම්ගත කරන ලද වටිනාකමක් වන අතර මෑතකාලීනව එම දඩ මුදල් ගෙවන ලෙස කිසිදු දැනුම් දීමක් සමාගම වෙත සිදු කර නොමැති බැවින් අදාළ මුදල් ගෙවීමට කටයුතු කර නොමැත. නමුත් මෙම ශේෂ පිළිබඳව ඉදිරියේදී සොයාබලා නිරවුල් කිරීමට බලාපොරොත්තු වේ.	අදාළ ශේෂය නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය.
(ආ)	වසර ගණනාවක සිට පැවත එන රු.8,425,296 ක්වූ ගෙවිය යුතු ආදායම් බදු දඩ මුදල් ශේෂය සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.	ගෙවිය යුතු ආදායම් බදු සඳහා දඩ මුදල් 2003 වසරේදී පමණ ගිණුම්ගත කර ඇති නිසාවෙන් අදාළ ශේෂය සනාථ කිරීම සඳහා තොරතුරු ගිණුම් අංශය තුල නොමැත.	නිවැරදි තොරතුරු අනාවරණය කරගැනීමෙන් අනතුරුව අදාළ බදු මුදල් ගෙවීමට කටයුතු කළ යුතුය.

2. මූල්‍ය සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.501,491,702 ක අලාභයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ අලාභය රු.473,942,776 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 27,548,926 ක පිරිහීමක් විය. මෙම පිරිහීමට විකුණුම් පිරිවැය, පරිපාලන වියදම් හා මූල්‍ය වියදම් ඉහළ යාම සහ විදේශ විනිමය අලාභය ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

2.2 ප්‍රධාන ආදායම් හා වියදම් විෂයයන්වල ප්‍රවණතා විශ්ලේෂණය

සමාගමේ අනෙකුත් ආදායම පසුගිය වර්ෂයට සාපේක්ෂව සියයට 92 කින් අඩු වීමට ඉකුත් වර්ෂයේ විදේශ විනිමය ලාභය සමාලෝචිත වර්ෂයේදී විදේශ විනිමය අලාභයක් බවට පත්වීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි. තවද මූල්‍ය

ආදායම සියයට 8.11 කින් අඩු වී තිබූ අතර මූල්‍ය වියදම සියයට 178 කින් වැඩි වී තිබුණි. ඉකුත් වර්ෂයට සාපේක්ෂව පරිපාලන වියදම් සහ වෙනත් වියදම් පිළිවෙලින් සියයට 24 කින් සහ සියයට 907 කින් වර්ධනය වී තිබුණි.

2.3 අනුපාත විශ්ලේෂණය

(අ) සමාගමේ සමාලෝචිත වර්ෂයේ දළ ලාභ අනුපාතය සියයට 10.11 ක් වූ අතර ශුද්ධ අලාභ අනුපාතය සියයට 3.11 ක් වී තිබුණි. එසේම කොටසක ඉපැයුම සමාලෝචිත වර්ෂයේදී සෘණ 0.55ක් වූ අතර පෙර වර්ෂයේදී එය සෘණ 0.54 ක් විය. ඒ අනුව සමාලෝචිත වර්ෂයේ කොටස් ප්‍රාග්ධනයට ඉපැයීමක් සිදු කර නොමැති අතර ආයතනයේ මෙහෙයුම් අකාර්යක්ෂමතාවයක් සහ කර්යසාධනය දූර්වල මට්ටමක පැවතීම සමාගමේ පැවැත්ම කෙරෙහි අහිතකර ලෙස බලපා ඇති බව නිරීක්ෂණය විය.

(ආ) සමාගමේ තෝලන අනුපාතය එනම් මුළු වත්කම් සහ මුළු වගකීම් සැලකීමේදී මුළු වත්කම් ඉක්මවා වගකීම් නොපැවතියද සමාලොචිත වර්ෂයේ එම අනුපාතය 0.72 ක් විය. එනම් මුළු වත්කම් වලට සාපේක්ෂව සමාගමේ මුළු ණය ප්‍රමාණය සියයට 72 ක් විය. ඉකුත් වර්ෂයේදී මෙම අනුපාතය සියයට 71 ක් විය. සමාලෝචිත වර්ෂයේ සමාගමේ මුළු ප්‍රාග්ධනයට ණය අනුපාතය 2.2 ක් විය. ඒ අනුව සමාගමේ ණය ප්‍රාග්ධනය ඉහල අගයක පවතින බවත් වත්කම් මූල්‍යනය ණය ප්‍රාග්ධනය මත සිදුකර ඇති බව කිරීක්ෂණය විය.

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

	විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	1980 මාර්තු 10 දින මැනුම් කරන ලද පිඹුරු අංක:4754 යටතේ රජයට අයිති අක්කර 40 රූඩ් 01 පර්චස් 36 ක් වන අඹේවෙල කර්මාන්තශාලාව ස්ථාපිතව ඇති ඉඩමෙහි සමාගම විසින් රු.මිලියන 5,548 ක් වටිනා ඉදිකිරීම් හා සවිකිරීම් කර ඇති නමුත් මෙම ඉඩමේ අයිතිය 2023 දෙසැම්බර් 31 දක්වාම සමාගමට පවරාගෙන නොතිබුණි.	රජය විසින් වසර 50ක බදු පදනමින් අදාළ ඉඩම සහ වෙනත් ඉඩම් 37ක් සඳහා සමාගම වෙත බදු ඔප්පු ලබාදීමට ප්‍රතිපත්තිමය තීරණයක් ගෙන ඇතත් එම ඔප්පු ලබාදීමට රජය විසින් මෙතෙක් කටයුතු කර නොමැත.	ඉඩමේ අයිතිය සමාගමට පවරා ගැනීමට අවශ්‍ය කටයුතු කළ යුතුය.
(ආ)	කෙරීගෙන යන වැඩවල ඇතුළත් ගැටඹේ අලෙවි සැල ඉදි කිරීම, දිගන කිරි කර්මාන්ත ශාලාවේ අයිස්ක්‍රීම් කප් සහ කෝන් පිරවුම් යන්ත්‍රය ස්ථාපනය කිරීම සහ පොළොන්නරුව, අඹේවෙල සහ දිගන කර්මාන්ත ශාලා නවීකරණයට අදාළව පිළිවෙලින් රු.150,000, රු.15,445,587 සහ රු.809,899,705 ක් වන ශේෂ 2012 වර්ෂයේ සිට අඛණ්ඩව ඉදිරියට ගෙන එමින් පැවති අතර එම	නුවර ගැටඹේ ප්‍රදේශයේ අලෙවිසැල ඉදිකිරීම මෙතෙක් අවසන් කර නොමැති බැවින් ඒ වෙනුවෙන් ගෙවා ඇති රු. 150,000 ක් කෙරීගෙන යන වැඩ තුල ඇතුළත්ව ඇත. දිගන කර්මාන්තශාලාව වෙත මීට වසර කිහිපයකට පෙර මිලදීගෙන ඇති රු.15,445,887 ක්වූ අයිස්ක්‍රීම් කප් හා කෝන් පිරවීමේ යන්ත්‍රය	ඉදිකිරීම් හා නවීකරණ කටයුතු නිම කර අපේක්ෂිත අරමුණු ඉටුකර ගැනීමට කටයුතු කළ යුතුය.

	ඉදිකිරීම් හා නවීකරණ කටයුතු නිමකර නොතිබුණි.	මෙතෙක් භාවිතා කළ හැකි මට්ටමකට පත්කර නොමැති බැවින් එයද කෙරීගෙන යන වැඩ තුල ඇතුළත් කර ඇත. දිගන කර්මාන්තශාලාව වෙනුවෙන් රු.809,899,705 ක් වැයකර තිබුණද මේ වන තෙක් එම නවීකරණ කටයුතු අවසන් කර නොමැති බැවින් එම වටිනාකමද කෙරීගෙන යන වැඩ තුල ඇතුළත් කර ඇත.	
(ඇ)	සමාලෝචිත වර්ෂයේ අවසාන තොග ශේෂය තුල ඇතුලත් රු.13,368,045 ක් වූ කිරි සිසිලක තොගය හා Bottle & Deep Freezer තොගය සම්බන්ධයෙන් පසුකාලීන පරීක්ෂාවේ දී එම තොග බෙදාහැරීමට අදාළ තොරතුරු විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.	අදාළ කිරි සිසිලක තොගයේ තොරතුරු අනාවරණය කරගැනීම මේ වනවිට සිදු කරමින් පවතින අතර අදාළ තොරතුරු හඳුනාගත් පසු විගණනය වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කරනු ලැබේ. එමෙන්ම බෝතල් හා අධි ශීතකරණ ශේෂය ගිණුම්කරණ දෝෂයක් වූ බැවින් එය 2024 ගිණුම් වර්ෂයේදී නිවැරදි කිරීමට කටයුතු කරන ලදී.	අදාළ තොග බෙදාහැරීමට අදාළ තොරතුරු විගණනයට ඉදිරිපත් කළ යුතුය.

3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

	විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	2023 වර්ෂයේදී සමාගමේ සේවක සුභසාධනය වෙනුවෙන් ග්‍රෑම් 750 බටර් පැකට් එකක් රු.330 බැගින් පැකට් 125,674 ක් සේවකයින්ට විකුණා රු.41,472,420 ක ආදායමක් උපයා තිබුණද, ඒ වෙනුවෙන් දරණ ලද රු.118,636,256 ක නිෂ්පාදන පිරිවැය ආවරණය නොවන මිලක් අයකිරීම හේතුවෙන් සමාගමට සේවක සුභසාධනය වෙනුවෙන් නිකුත් කර තිබූ බටර් පැකට් තුළින් රු.77,163,836 ක අලාභයක් සිදුවී තිබුණි.	ඉදිරියේදී මෙම අයිතමය සුභසාධන පදනමින් අලෙවි කිරීමේදී නිෂ්පාදන පිරිවැය ආවරණය වන මිලක් අයකිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට බලාපොරොත්තුවේ.	නිෂ්පාදන පිරිවැය ආවරණය වන මිලක් අයකිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය.
(ආ)	සමාලෝචිත වර්ෂයේ විකුණුම් ප්‍රමාණයන් පෙර වර්ෂයේ විකුණුම් සමඟ සැසඳීමේදී UHT කිරි (plain) 900ml නිෂ්පාදිතය ඒකක 5,468,308 සිට 2,948,320 දක්වා එනම් සියයට 46 කින්ද, UHT කිරි (plain) 450ml නිෂ්පාදිතය ඒකක 6,817,706 සිට	විකුණුම් අඩුවීමට ප්‍රධාන හේතුව වූයේ සමාගමේ පොළොන්නරුව කර්මාන්තශාලාවේ UHT නිෂ්පාදන යන්ත්‍රය 2023 අප්‍රේල් හා මැයි මාසය තුලදී සම්පූර්ණ වශයෙන් අක්‍රීය වීමත්	වාර්ෂික නිෂ්පාදන හා අලෙවි ඉලක්ක ලඟා කර ගැනීමට කටයුතු කළ යුතුය.

	4,416,517 දක්වා එනම් සියයට 35 කින්ද අඩු වී තිබුණි.	අලුත්වැඩියාවෙන් පසු 2023 ජූනි, ජූලි හා අගෝස්තු යන මාස වලදී නිෂ්පාදන යන්ත්‍රයේ පැවති දෝෂ තත්වය හේතුවෙන් ඉලක්කගත නිෂ්පාදනය සිදුකිරීමට නොහැකි වීමත්ය. එසේම 2022 වර්ෂයට සාපේක්ෂව 2023 වර්ෂය තුලදී ආයතනය මගින් මිලදී ගනු ලැබූ දියර කිරි ලීටර ප්‍රමාණය අඩු වීම හේතුවෙන් සමාගමේ ඉලක්කගත නිෂ්පාදන ධාරිතාවයට ලගාවීමට නොහැකි වීමද අදාළ විකුණුම් අඩුවීම හේතුවී ඇත.	
(ඇ)	සමාගමේ නිෂ්පාදන කටයුතුවල නිරතවන කර්මාන්තශාලා 5 අතරින් අඹේවෙල කර්මාන්තශාලාව පමණක් 2022 හා 2023 වර්ෂවලදී ලාභ වාර්තා කර තිබුණි. අනෙක් කර්මාන්තශාලා 4 වන දිගන, පොල්ගහවෙල, පොළොන්නරුව හා කොළඹ යන කර්මාන්තශාලා 2022 සහ 2023 වර්ෂවලදී අලාභ වාර්තා කර තිබුණු අතර එම කර්මාන්තශාලා 4 හි 2022 හා 2023 වර්ෂවල මුළු අලාභය පිළිවෙලින් රු.1,000,747,087 ක් සහ රු.345,248,601 ක් විය.	ඇසුරුම් ඇතුළු සියලුම අමුද්‍රව්‍ය මිල ගණන් ඉහළ යාමත්, එවායේ සැපයුම අඩුවීමත්, පැවති සංචරණ සීමා යටතේ මූලික යෙදවුම් ද්‍රව්‍ය වන අමුකිරි සපයා ගැනීම දුෂ්කරවීමත් හා කාරක ප්‍රාග්ධනය සපයා ගැනීම වෙනුවෙන් වැඩි මූල්‍ය පිරිවැය දැරීමට සිදුවීමත්, සමාලෝචිත කාලය තුළ මිල්කෝ ආයතනය අලාභ ලැබීමට හේතු විය.එසේම, අඹේවෙල කර්මාන්තශාලාව පමණක් ලාභ වාර්තාකර අනෙකුත් කර්මාන්තශාලාවන් අලාභ වාර්තා කිරීමට හේතුවී ඇත්තේ, අනෙකුත් කර්මාන්තශාලාවන්ට සාපේක්ෂව අඹේවෙල කර්මාන්තශාලාවේ සිදුකරන නිෂ්පාදන වර්ග සඳහා සීමිත අමුද්‍රව්‍ය ප්‍රමාණයක් අවශ්‍යවීමත් සහ පැවති දුෂ්කරතා හේතුවෙන් අනෙකුත් කර්මාන්තශාලාවන්හි නිෂ්පාදන මට්ටම් අඩුවී මෙහෙයුම් පිරිවැය වැඩිවීමත් ය.	නිෂ්පාදන කටයුතුවල නිරත කර්මාන්තශාලා ලාභ ලබන තත්වයට පත්කරගැනීමට කටයුතු කළ යුතුය.
(ඈ)	සමාගම විසින් 2021 වර්ෂයේ සිට 2023 වර්ෂය දක්වා කාල සීමාව තුල එකතු කළ දියර කිරි ලීටර් ප්‍රමාණය එකතු කිරීමට අපේක්ෂිත කිරි ප්‍රමාණයට සාපේක්ෂව සියයට 67 ත් සියයට 71 ත් අතර පරාසයක පැවති අතර ඒ අනුව අදාළ කාලසීමාව තුළ එකතු කරන ලද දියර කිරි ප්‍රමාණය කිරි ලීටර් 67,905,259 සිට 39,775,076 දක්වා අඛණ්ඩව අඩු වී තිබුණි.	2021 වර්ෂයට සාපේක්ෂව 2022 වර්ෂය තුළ කිරි අඩුවීම සඳහා තරඟකාරී කිරි එකතුකරන්නන් කිරි කර්මාන්තයට එකතුවීමත්, ඔවුන් විසින් කිරිවල ගුණාත්මක තත්ත්වය නොසලකා කිරි මිලදී ගැනීමත් හේතුවිය. එමෙන්ම, 2022 වර්ෂයට සාපේක්ෂව 2023 වර්ෂය තුළ කිරි අඩුවීම සඳහා	සමාගමේ නිෂ්පාදනයන් සඳහා ප්‍රධාන අමුද්‍රව්‍ය වන කිරි එකතු කිරීමේ අපේක්ෂිත ඉලක්කයන් සපුරාගැනීමට කටයුතු කළ යුතුය.

	තවද අදාළ කාල සීමාව තුල රටේ සමස්ථ දියර කිරි නිෂ්පාදනයෙන් සමාගම විසින් එකතු කරන ලද කිරි ප්‍රමාණයේ ප්‍රතිශතය සියයට 13 සිට සියයට 08 දක්වා අඩු වී තිබූ බව ද නිරීක්ෂණය විය.	අනෙකුත් තරඟකරුවන්ට සාපේක්ෂව, නිවැරදි කාලසීමාවේ දී මිල්කෝ ආයතනය විසින් කිරි මිල වැඩි කිරීමට අපොහොසත් වීම මූලිකවම හේතුවිය.	
(ඉ)	සමාගම විසින් 2021 වර්ෂයට සාපේක්ෂව 2023 වර්ෂයේදී නිෂ්පාදනය කල නිෂ්පාදන වර්ග 11 කින් UHT කිරි, Sterilized කිරි, යෝගට්, එළඟිතෙල්, බටර් හා කිරිපිටි යන නිෂ්පාදන වර්ග 06 හි නිෂ්පාදිත ඒකක ප්‍රමාණය අඛණ්ඩව අඩු වී තිබුණි. එය 2021 වර්ෂයට සාපේක්ෂව 2023 වර්ෂයේ නිෂ්පාදන ඒකක ප්‍රමාණය අවමය ඒකක 52,921ත් උපරිමය ඒකක 8,607,299ත් අතර පරාසයකින් අඩු වී තිබුණු බව නිරීක්ෂණය විය. උකුකිරි සහ අයිස්ක්‍රීම් යන නිෂ්පාදිතයන් 2022 වර්ෂයට සාපේක්ෂව ප්‍රවර්තන වර්ෂයේ වර්ධනයක් පෙන්නුම් කළද, 2021 වර්ෂයේ පැවති නිෂ්පාදන ඒකක ප්‍රමාණයට සාපේක්ෂව අඩුවී වී තිබුණි.	නිෂ්පාදන සඳහා මූලික අමුද්‍රව්‍ය වන අමු කිරි එකතු කිරීම අඩුවීමට සාපේක්ෂව නිෂ්පාදනය ද අඩුවිය. පැවති සීමිත කිරි ප්‍රමාණයන් වෙළඳපොළ ඉල්ලුමට අනුකූලව එක් එක් නිෂ්පාදන වර්ග අතර බෙදා නිෂ්පාදනයන් සිදුකරන ලදී.	සමාගමේ වෙළඳපොළ කොටස ආරක්ෂාකර ගැනීමට සහ වර්ධනය කිරීමට ප්‍රමාණවත් පරිදි නිෂ්පාදන කටයුතු සිදුකිරීමට කටයුතු කළ යුතුය.
(ඊ)	පාස්චරිත කිරි, Sterilized කිරි, UHT කිරි, බටර්, එළඟිතෙල් සහ කිරිපිටි යන නිෂ්පාදන සිදුකිරීම සඳහා කර්මාන්තශාලා සතුව පවතින නිෂ්පාදන ධාරිතාවයෙන් සියයට 50 කට අඩු ධාරිතාවක් උපයෝජනය කරනු ලබන අතර යෝගට්, අයිස්ක්‍රීම් සහ උකුකිරි යන නිෂ්පාදන සිදුකිරීම සඳහා කර්මාන්තශාලා සතුව පවතින නිෂ්පාදන ධාරිතාවයෙන් සියයට 50 ත් සියයට 75ක් අතර ප්‍රමාණයක් පමණක් භාවිතා කරනු ලබයි. තවද බීස් නිෂ්පාදන කටයුතු දිගන කර්මාන්තශාලාවේ පමණක් සිදු කරන අතර එය උපරිම ධාරිතාවයට ලඟා වී තිබුණු බව නිරීක්ෂණය විය.	නිෂ්පාදන සඳහා මූලික අමුද්‍රව්‍ය වන අමු කිරි එකතු කිරීම අඩුවීමට සාපේක්ෂව නිෂ්පාදනය ද අඩුවිය. පැවති සීමිත කිරි ප්‍රමාණයන් වෙළඳපොළ ඉල්ලුමට අනුකූලව එක් එක් නිෂ්පාදන වර්ග අතර බෙදා නිෂ්පාදනයන් සිදුකරන ලදී.	කර්මාන්තශාලා සතුව පවතින නිෂ්පාදන ධාරිතාවය උපරිම ලෙස ප්‍රයෝජනයට ගැනීමට කටයුතු කළ යුතුය.

(උ)	2021 වර්ෂයේ සිට 2023 දක්වා කාලසීමාව තුළ දියර කිරි විකුණුම් ප්‍රමාණය ලීටර් 20,538,423 සිට ලීටර් 13,258,335 දක්වා අඛණ්ඩව අඩු වී තිබූ අතර එය 2021 වර්ෂයේ විකුණුම්වලට සාපේක්ෂව සියයට 35 ක අඩුවීමක් බව නිරීක්ෂණය විය. තවද 2021 වර්ෂයේ සිට 2023 දක්වා කාලසීමාව තුළ යෝගට්, එළකිතෙල්, බටර් සහ උකු කිරි යන නිෂ්පාදිතයන්ගේ විකුණුම් ප්‍රමාණයන් ද අඛණ්ඩව අඩු වී තිබූ බව නිරීක්ෂණය විය.	සමස්ථ කිරි නිෂ්පාදනය අඩුවීමට සාපේක්ෂව දියර කිරි නිෂ්පාදනය ද අඩුවිය. එමෙන්ම නිෂ්පාදනයට සාපේක්ෂව විකුණුම් ප්‍රමාණයන් ද අඩුවිය.	සමාගමේ වෙළඳපොළ කොටස ආරක්ෂාකර ගැනීමට සහ වර්ධනය කිරීමට කටයුතු කළ යුතුය.